*30 වෙනි පිටුවෙන් (හද රිදවන )*

ප්‍රසංගයට සුනිලා සහෝදරියගේ සහභාගි වීම අවශ්‍ය නොමැති බවටත් තීරණය කරන ලදී. මෙම තීරණ දැනුම් දීමත් සමඟ පක්ෂය සමඟ ඇයගේ තිබුන සම්බන්ධතාවය අවසානයට පත් විය. පක්ෂය තුල කෙලී සහෝදරයා දැරූ වගකීම් දේශපාලන මණ්ඩල සභිකයෙකුගේ සිට මධ්‍යම කාරක සභිකයෙක් දක්වා පහත හෙලන ලදී. එහෙත් රෝහණ සහෝදරයා ඇතුළු තවත් අය විසින්, පුරුෂ ආධිපත්‍යවාදී නිර්-සමාජවාදී මති මතාන්තර සහ දෘෂ්ඨි කෝණ අනුව යමින්, කරන ලද ඇතැම් ප්‍රකාශ හේතුවෙන් කෙලී සහෝදරයාත් පක්ෂයේ සෙසු සහෝදර සහෝදරියනුත් අතර පැවති සහෝදරත්වය තව දුරටත් පලුදු වී යමින් තිබිණ. පසු කාලයකදී කෙලී සහෝදරයා පක්ෂයෙන් ඉවත් වී සුනිලා සහෝදරියත් සමඟ එකට ජීවත් වන්නට පටන් ගත්තේය.

එහෙත් කල් ගත වීමත් සමඟ දේශපාලන මණ්ඩලය, විශේෂයෙන්ම රෝහණ සහෝදරයා, මෙම කරුණු සම්බන්ධයෙන් පක්ෂය විසින් අනුගමනය කරන ලද ක්‍රියා මාර්ගය වුවමනාවට වඩා දැඩි සහ අපරිණත එකක් වූ බව උපේක්ෂා සහගත ලෙසකින් දුටුවේය. නාගරික සහ ගම්බදින් පැමිණි ජන කොටස් අතර මෙවැනි ප්‍රශ්ණ සම්බන්ධයෙන් පැවතුන පරතරය ඉමහත් විය. සුනිලා දැඩි ලෙස කාන්තා විමුක්ති ස්ථාවර දැරූ හැඟීම් බර සහ හැඟීම් දනවන සහෝදරියක් වූ අතර මෙම කාලය වන විට දී පවා කෙලී සහෝදරයා දේශපාලන වශයෙන් පක්ෂයට හිතවත් ව සිටියේය. ඔහු 1960 ගණන් වල සිටම ස්ථාවර ලෙස පක්ෂය සමඟ සිටි සහෝදරයෙක් ද විය. 1979 දී පමණ කුරුණෑගල පැවති ජනතා විමුක්ති පෙරමුණේ පළමුවැනි පක්ෂ සම්මේලණයේ දී රෝහණ සහෝදරයා මේ පිළිබඳව කරුණු දක්වමින් පක්ෂය විසින් අනුගමනය කරන ලද දැඩි ක්‍රියා මාර්ගය පිළිබඳව කණගාටුව පළ කර සිටියේය. පළමුවැනි පක්ෂ සම්මේලනයේ තීරණය අනුව කෙලී සහෝදරයා සහ සුනිලා සහෝදරිය නැවත ජනතා විමුක්ති පෙරමුණේ වැඩ කටයුතු වලට සම්බන්ධ කර ගැනීම සඳහා මා ඔවුන් හමු වී සාකච්ඡා කළ නමුත් ඔවුන්ගෙන් එක් අයෙක් වත් ඒ සඳහා එකඟ කරවා ගන්නට නොහැකි විණි. රෝහණ සහෝදරයා ද දෙහිවල තිබුනු නවමඟ මුද්‍රණාලයට ගොස් කෙලී සහෝදරයා හමු වී මේ පිළිබඳව සාකච්ඡා කළ නමුත් ඔහුගේ එම ඉල්ලීම ද ප්‍රතික්ෂෙප කොට තිබිණි.

රෝහිත මුණසිංහ සහෝදරයා ඉදිරිපත් කර තිබෙන අන්දමට, දේශපාලන මණ්ඩල රහස් කිහිපයක් පිටවී තිබීම නිසා කෙලී සහෝදරයා සැකයට භාජන වු බවක් හෝ බලවත් සේ කුපිත වී පක්ෂය හැරදමා යාමට සුදානම් වන විට ඊට පෙර ඔහු පක්ෂයෙන් ඉවත් කළ බවක් හෝ විමුක්ති ගී කණ්ඩායම තුළ සුනිලාගේ හැසිරීම ප්‍රශ්ණකාරී වීම සහ සංවරව නොසිට පුද්ගලිකව කැපී පෙනීමට උත්සාහ කිරීම නිසා ඇය විමුක්ති ගී කණ්ඩායමෙන් ඉවත් කෙරුණු බවක් හෝ ඉහත සාකච්ඡා කළ කරුණු වලින් නම් දැක්වෙන්නේ නැත. මෙම සිද්ධිදාමය සිදු වී වසර 13කට පමණ පසු ප්‍රංශයේ පළ කෙරෙන ජ.වි.පෙ. ජාත්‍යන්තර අංශයේ 'අරුණෝදය' පුවත්පතේ 1993 අප්‍රේල් කලාපයේ පළ වූයේ යයි පවසන පුවත ගැන පුදුම වෙන්නට තරම් යමක් නැත්තේ ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වූ හෝ ඉවත් කෙරුණු අයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ විසින් එල්ල කරනු ලබන අවලාද සහ මඩ ගැසීම් ගැන බොහෝ දෙනෙකුට මනා අවබෝධයක් ඇති හෙයිනි.

චිත්‍රා සහෝදරිය ගැන රෝහිත මුණසිංහ සහෝදරයා විසින් ඉදිරිපත් කර තිබෙන අවලාද සහ මඩ ගැසීම් කිහිපයක් ගැන කරුණු විස්තර කිරීමක් මෙම ලිපියේ මීළඟ කොටසින් බලාපොරොත්තු වන්න.

*32 වන පිටුවෙන් (තවත් අදහසක්)*

ලේඛන සකස් කිරීම, තමන්ට අනතුරුදායක වූවත් කවර හෝ රුකියාවක් කිරීම සඳහා නගරයේ පදිංචියට පැමිණීම, පාසැලකට දරුවන් ඇතුලත් කර ගැනීම සඳහා මූල්‍ය සහ ශාරීරික අල්ලස් ලබා දෙන්නට පවා ඉදිරිපත් වීම වැනි කරුණු මෙසේ ලාංකීය සමාජය තුල ඇති කොට තිබෙන සමහර වෙනස්කම් ලෙස සැලකිය හැකිය. මේ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රය අල්ලස් ගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් වීම පුදුම වෙන්නට කාරණයක් නොවේ. මෙම අධ්‍යාපන ඉල්ලුමට අනුපාතික ලෙස නගරයේ ප්‍රධාන පාසැල් අසළ ඉඩ කඩම් මිල ඉහළ ගියේය. පස්වන වසරේ ශිෂ්‍යත්ව පරීක්ෂණය සඳහා සකස් කෙරෙන ප්‍රශ්ණ පත්‍ර මෙම ඉල්ලුමට අනුව සකස් කරන්නට පටන් ගැනුණේය. මෙම ජීවන - අධ්‍යාපන තරඟයේ ප්‍රතිඵලයක් ලෙස උදය හතරේ කණිසමට ඇහැරෙන දෙමව්පියනුත් දරුවනුත් අනේක දුක් විඳ පාසැලට ගොස් ඇතැම් ගුරුවර ගුරුවරියන්ගෙන් හරිහැටි අධ්‍යාපනයක් පවා නොලැබ, පාසැල හැරුන පසු පුද්ගලික අධ්‍යාපන පංතිවල තවත් පැය ගණනක් කල් ගතකොට යලි නිවසට පැමිණෙන්නේ මහ රාත්‍රීයේ ය. මේ අනුව අපේ රටේ දරුවන්ට ළමා කාලයක් ගත කරන්නට අවස්ථාවක් නොමැති වීම පුදුම වෙන්නට තරම් කාරණයක් නොවේ.

බොහෝ දෙමව්පියන් විසින් තම දූ දරුවන් ජනප්‍රිය පාසැල් වලට ඇතුලත් කිරීමට උනන්දු වූවත් මෙම පාසැල්වලට යන එම දූ දරුවන්ටද සිදු වී ඇත්තේ ප්‍රසිද්ධ ගුරුවරුන්ගේ පුද්ගලික අධ්‍යාපන පංතිවල පිහිට පැතීමටය. ඇතැම් විට ජනප්‍රිය පාසැලේ තම ගුරුවරයා වගකීමෙන් යුක්තව උගැන්වීමේ නොයෙදෙන හෙයින් මෙම දරුවන්ට එවැනි අධ්‍යාපනයක් පුද්ගලික ව ලබා ගැනීමට සිදු වී තිබෙන්නේ ජනප්‍රිය පාසැලේ උගන්වන තම ගුරුවරයාගෙන් ම වීම කෙතරම් අවාසනාවක් ද?

මෙම තත්වය පිළිබඳව මීළඟ ලිපියෙන් තවදුරටත් සාකච්ඡා කරමු.

නිවාස සහ ඉඩකඩම් නවීකරණය කරගැනීමට
ඔබ සිතනවාද?
SETSQUARE PROPERTY
DEVELOPMENT
ARCHITECTURAL DESIGNS FOR
Subdivisions
(Make use of your Large Backyard)
New Homes/Units
Development Plans
Extensions and Renovations
COVERS ALL SUBURBS
For Obligation Free Consultations
saamArt
Contact - Asanka Jayawardena
Mob : 0402 443 554 Tp : 9323 7393
asankapj@gmail.com

Migration Solutions
Are you, your friend or your relative seeking solutions for....?
- Students visa issues
- Family migration(parent, spouse etc)
- Skilled Migration (Onshore and Offshore)
- Visitor visa
- Visa cancellations issues (MRT Reviews)
Honest, reliable service assured, at affordable rates.
Call: 61 3 9547 3022
MIA
Member of Migration Institute of Australia

Manoj Dodamgoda
AUSGATE
Migration Consultancy Services
Grad.Cert. (Immi. Law), BIT
Member of Migration Institute of Australia
MARN: 0854504
No. 9/61-63 Buckley Street, Noble Park, Victoria 3174, Australia
Tel: 61 3 9547 3022 Mob: 61 430 642 774 Fax: 61 3 9547 3022
Email: manoj@ausgatemig.com.au